# ශ්‍රී ලංකාවේ නීතිමය සහ නියාමක රාමුව පිළිබඳ හැඳින්වීම - ( 5 % )

## නීතිය යනු කුමක්ද ?

මෙම පැනයට විවිධ සාර්ථක පිලිතුරු ඇත.

- නීතිය යනු අපරාධ පාලනය සඳහා බිහිවී ඇති දෙයකි .
- නීතිය යනු ප්‍රජාවක් පාලනය කරන රීති පද්ධතියකි .
- නීතිය යනු සමාජයේ යහපැවැත්ම උදෙසා බිහිවී ඇති දෙයකි.

ආදී වශයෙන් වූ පිලිතුරු, සාර්ථක පිලිතුරු ලෙස පිලිගැනේ.

> **නීතිය යනු**
> **සමාජය නිසි ලෙස නියාමනය කිරීම හෝ ජීවිතයේදී හැසිරීම් නිවැරදි කිරීම සඳහා සාදන ලද රීතින්ය.**

# නීති සාදන්නේ කවුද ?

- නීති සැදීමේ බලය හෙවත් ව්‍යවස්ථාදායක බලය ජනතා පරමාධිපත්‍යයෙහි ප්‍රධාන අංගයකි.
- අපගේ උත්තරීතර නීතිය වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනතා පරමාධිපත්‍යය, ජනතාව කෙරෙහි පිහිටා ඇති අතර, ජනතාවට එය අත්හල නොහැක්කේය.
- එනම් මෙරට උත්තරීතර නීතිය අනුව, මෙරට තුල නීති සෑදීමේ බලය ඇත්තේ ලක්වැසි ජනතාවටමය. තවද ජනතාවට එම බලය අත්හල නොහැක්කේය.
- එහෙත්,මෙරට සියලුම දෙනාට එක් තැනකට එකතු වී තමන්ට බලපාන ආකාරයට නීති සැදීම ප්‍රායෝගිකව කල නොහැක.
- එමනිසා ජනතාව මහමැතිවරණයකදී හෙවත් පාර්ලිමේන්තු මැතිවරණයකදී තමා වෙනුවෙන් නීති සෑදීමේ කටයුත්ත සඳහා මහජන නියෝජිතයන් පාර්ලිමේන්තුවට තෝරා පත් කර යවති.

ඒ අනුව මෙරට තුල නීති සෑදීම සිදු කරනු ලබන්නේ මහජන නියෝජිතයන්ගෙන් යුතු පාර්ලිමේන්තුව විසිනි.

# ජනතාව නීතියෙන් බැඳෙන්නේ ඇයි ?

- මෙරට තුල නීති සෑදීම සිදු කරනු ලබන්නේ මහජන නියෝජිතයන්ගෙන් යුතු පාර්ලිමේන්තුව විසින් බව ඔබ දැනටමත් දනී.
- මහජන නියෝජිතයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුව තුලින් පිලිඹිබු වන්නේ ජනතා අභිලාෂයන් සහ සිතුම් පැතුම්ය.
- ඒ අනුව මහජන නියෝජිතයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුව විසින් නීති සෑදීම යනු ජනතාව විසින් නීති සෑදුවා හා සමානය.

තමා විසින් සාදනු ලබන නීතියෙන් තමා බැඳී සිටිය යුතු වන බැවින් ජනතාව නීතියෙන් බැඳෙති.

- ජනතාව → ( සෘජුව නොව ) → නීති සෑදීම

↘ මහජන නියෝජිතයන් මගින් ( වක්‍රාකාරව ) ↗

# නීතිය නොදැනීම, නීතිය කඩ කිරීමේ වරදට සමාව ලබා ගත හැකි විත්තිවාචකයක් නොවන්නේ ඇයි ?

- විත්තිවාචකයක් යනු නිදහසට කරුණක් යන්නයි.
- පාර්ලිමේන්තුව විසින් නීති සෑදීමේ කටයුතු සිදු කරනු ලබන්නේ විවෘතවය.
- පාර්ලිමේන්තුව විසින් සම්මත කල සහ සම්මත කරන්නට යන නීතීන් පිලිබඳව දැනුවත් වීමේ අවස්ථාවන්, රජය විසින් ජනතාවට සලස්වා ඇත.

ඒ අනුව, සියලුම දෙනා නීතිය දැනසිටී යනුවෙන් සමාජයේ පූර්ව නිගමනයක් පවතින නිසා නීතිය නොදැනීම, නීතිය කඩ කිරීමේ වරදට සමාව ලබා ගත හැකි විත්තිවාචකයක් නොවේ.

එබැවින් යම් පුද්ගලයෙකු විසින් යම් නීති කඩ කිරීමක් සිදු කල විටකදී, එවන් නීතියක් ඇති බව තමා නොදැන සිටියේයැයි පවසමින් එම නීතිය කඩ කිරීමේ වරදින් නිදහස් වීමට කිසිවෙකුටත් හැකියාවක් නැත.

# වාණිජ නීතිය හෝ ව්‍යාපාර නීතිය යනු කුමක්ද ?

- ❖❖ **වඩාත් සරලව හැඳින්වුවහොත් වාණිජ නීතිය හෝ ව්‍යාපාර නීතිය යනු වාණිජ සහ**
  – **ව්‍යාපාර කටයුතු වලට අදාල වන නීතීන් සමූහයයි.**
- ❖❖ මෙහි අන්තර්ගත වන්නේ ව්‍යාපාර, වාණිජ සහ වෙළඳ කටයුතුවල නිරත වන පුද්ගලයන්ට අදාල අයිතිවාසිකම්, යුතුකම් සහ වගකීම් ය.
- ❖❖ ශ්‍රී ලංකාවට අදාල වාණිජ නීතිය ඉංග්‍රීසි නීතිය මත පදනම්ව ඇත.
- ❖❖ මෙරට වාණිජ සහ ව්‍යාපාර කටයුතු වලට අදාලව පාර්ලිමේන්තුව විසින් සම්මත කර ඇති බොහෝ නීතීන් ඉංග්‍රීසි නීතිය මත පදනම් ව ඇත. උදාහරණ -
- ⇨ 2007 අංක 07 දරණ සමාගම් පනත
- ⇨ 1987 අංක 36 දරණ සුරැකුම්පත් සහ විනිමය පනත
- ⇨ දේශීය ආදායම් පනත
- ⇨ සාප්පු සහ කාර්යාල සේවක පනත
- ⇨ 1896 අංක 11 දරණ භාණ්ඩ විකිණීමේ ආඥා පනත

- ❖❖ මෙරට වාණිජ නීතියට අදාලව ඉංග්‍රීසි නීතියෙන් ආවරණය නොවන යම් විෂය පථයක්, මෙරට පොදු නීතිය වන රෝම ලන්දේසි නීතියෙන් ආවරණය වේ

# නීති මූලාශ්‍ර / නීති ප්‍රභව ( Sources of Law )

- නීති මූලාශ්‍රයක් හෙවත් නීති ප්‍රභවයක් යනු නීතිය ආරම්භ වන ස්ථානයක් ( එනම් නීතිය හට ගන්නා ස්ථානයක් ) වේ.
- තවද, යම් කාරණාවකට අදාල වන නීතිය පිලිබඳව සඳහන් කර ඇති ස්ථානයක්ද එකී නීතියට අදාල නීති මූලාශ්‍රයක් ලෙස හැඳින්වේ.

ඒ අනුව, නීති මූලාශ්‍රයක් යනු නීතිය සොයා ගත හැකි තැනකි.

- වැදගත්කමේ අනුපිලිවෙලට මෙරට ප්‍රධාන නීති මූලාශ්‍ර පහත පරිදි වේ.
  - ❒ පනත් / ව්‍යවස්ථා
  - ❒ ඉහල අධිකරණ නඩු තීන්දු
  - ❒ සිරිත් / චාරිත්‍ර

# ව්‍යවස්ථා / පනත්

- ✍ ව්‍යවස්ථා හෙවත් පනත් යනු පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද නීතියයි.
- ✍ මෙය මෙරට ප්‍රධානතම නීති මූලාශ්‍රය ද වේ.
- ✍ ඒ අනුව යම් කාරණාවකට අදාල වන නීතිය පිලිබඳව සොයා දැන ගැනීම සඳහා පලමුව යොමු විය යුත්තේ එකී කාරණාවට අදාලව පාර්ලිමේන්තුව විසින් සම්මත කර ඇති පනතක් ඇත්නම් ඒ පනත වෙතය.
  - පනත් යනු 1948 වර්ෂයෙන් පසුව මෙරට ව්‍යවස්ථාදායකය වන පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ නීතියයි.
  - ආඥා පනත් යනු මෙරටට නිදහස ලැබීමට පෙර, එනම් 1948 වර්ෂයට පෙර මෙරට නීති සම්පාදක ආයතනය හෙවත් ව්‍යවස්ථාදායකට වූ රාජ්‍ය මන්ත්‍රණ සභාව විසින් සම්මත කරනු ලැබූ නීතියයි.

නෛතික බලපෑම අතින් පනත් සහ ආඥා පනත් අතර කිසිඳු වෙනසක් නැත.

- ✍ පාර්ලිමේන්තුව විසින් පනතක් නිසි පරිදි සම්මත කිරීම සඳහා විවිධ අදියරයන් පසු
- කල යුතුය.
- ✍ පනතක් නිසි පරිදි සම්මත වීමට පෙර එය පනත් කෙටුම්පතක් ලෙස හැඳින්වේ.
- ✍ පාර්ලිමේන්තුව විසින් ස්වකීය නීති සෑදීමේ ක්‍රියාවලිය තුල, දැනට තිබෙන නීති
- සංශෝධනය කිරීම, දැනට තිබෙන නීති පරිච්චින්න කොට නව නීති සෑදීම, සහ
- අලුතින්ම නව නීති සෑදීම සිදු කරනු ලබයි.

✍ සාමාන්‍ය පනතක් පාර්ලිමේන්තුව තුල සම්මත කරනු ලබන්නේ සරල බහුතර

- ඡන්දයෙනි.
- ✍ එහෙත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෙවත් මෙරට උත්තරීතර නීතිය සංශෝධනය කිරීම සඳහා නොපැමිණි මන්ත්‍රීවරුන්ද ඇතුලුව විශේෂ බහුතර ඡන්දයෙන් ( එනම්, 2/3 ) සම්මත විය යුතුය.
- ✍ දැනට වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වන අතර එය
- මෙම මොහොත වන විට අවස්ථා 20 කදී සංශෝධනය වී ඇත.
- ✍ පාර්ලිමේන්තුව විසින් පනවනු ලබන සෑම පනතක්ම ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුකූල
- විය යුතු බවට අපේක්ෂා කෙරේ.

- ✍ පාර්ලිමේන්තුව විසින් නීතියක් සම්මත කිරීම සඳහා යම් සැලකිය යුතු කාලයක් ගත
- වෙයි.
- ✍ එහෙයින් සමහර අවස්ථා වලදී පාර්ලිමේන්තුව සතු මෙම නීති සෑදීමේ බලය විවිධ
- ආයතන සහ පුද්ගලයන් වෙත අභිනියෝජනය කිරීමක් හෙවත් වෙනත් ආයතන සහ
- පුද්ගලයන් වෙත පවරා දීමක් දක්නට ලැබේ. එලෙස සම්මත කරනු ලබන නීති
- වලට අභිනියෝජිත ව්‍යවස්ථා හෝ අනු ව්‍යවස්ථා හෝ අනු නීති යැයි කියනු ලැබේ.
- ✍ අභිනියෝජිත ව්‍යවස්ථා වලට උදාහරණ -
  - ➔ අමාත්‍යවරුන් විසින් සාදන නියෝග, විධාන, ප්‍රකාශන
  - ➔ අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් සාදන නියෝග, විධාන, ප්‍රකාශන
  - ➔ ජනාධිපතිවරයා විසින් හදිසි නීති රෙගුලාසි සෑදීම.
  - ➔ පලාත් සභා සහ පලාත් පාලන ආයතන විසින් සාදනු ලබන ප්‍රඥප්ති සහ අතුරු ව්‍යවස්ථා

◆❖◆ අභිනියෝජිත ව්‍යවස්ථා බලාත්මක වීමට නම් ඒවා පසු අවස්ථාවකදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කොට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. ◆❖◆

# ඉහල අධිකරණ තීරණ

- ☛මෙය දෙවන නීති මූලාශ්‍රය වන අතර වැදගත්කම අතින් දෙවැනි වන්නේ පනත් වලට
- පමණි.
  - මෙරට අධිකරණ ධුරාවලිය / අධිකරණ ථෛරාවලිය / අධිකරණ පිළිවෙල

ශ්‍රේෂ්ඨාධිකරණය

අභියාචනාධිකරණය

ඉහල අධිකරණ / උපරිමාධිකරණ ( අභියාචනා අධිකරණ )

මහාධිකරණය

දිසා අධිකරණය

මහේස්ත්‍රාත් අධිකරණය

ප්‍රාථමික අධිකරණය

පහල අධිකරණ / මුල් අවස්ථා අධිකරණ



සැකසුම - ප්‍රභාත් විජයසිරි ( LLB )( AAL )

- සෑම අවස්ථාවක්ම ආවරණය වන සේ නීති සෑදීමට පාර්ලිමේන්තුවට හැකියාවක් නැත. එය ප්‍රායෝගිකද නොවේ.
- තවද පාර්ලිමේන්තුව විසින් සම්මත කර ඇති පනත් වල සමහර වගන්තීන් අපැහැදිලි විය හැකි සේම තවත් සමහර වගන්තීන් බහු අරුත් ඇති ඒවා විය හැකිය.
- එහිදී ප්‍රධාන නීති මූලාශ්‍රය ලෙස පනත් මගින් ආවරණය නොවන ගැටලුවකදී ද්වීතියික නීති මූලාශ්‍රයක අවශ්‍යතාවය පැන නගී.
- ඒ අනුව දෙවන වැදගත්ම නීති මූලාශය වන්නේ ඉහල අධිකරණ තීරණයන් ය.
- ඒ  අනුව මෙරට උපරිමාධාකරණයන් වන ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය විසින් ලබා දෙන නඩු තීන්දු මෙරට නීති මූලාශ්‍රයක් ලෙස සැලකේ.
- එලෙස ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය  විසින් නීති සෑදීම සිදු කරනු ලබන්නේ නීති මූලධර්මයක් උච්චාරණයෙන් හෝ ව්‍යවස්ථාවක් අර්ථ නිරූපනය කිරීම මගිනි
- ඉහල අධිකරණ නඩු තීන්දු ප්‍රසිද්ධ ලේඛණ වන අතර බොහෝ නඩු තීන්දු, වර්ගකර පොත් ආකාරයෙන් වාර්තාගත කර ඇත. ඕනෑම කෙනෙකුට ඒවා පරිශීලනය කිරීමේ හැකියාව ඇත.
- මෙම නීති මූලාශ්‍රය, “ විනිශ්චයකාරවරුන් විසින් සාදන ලද නීති ” , “ පනවනු නොලැබූ නීති ” හෝ “ අධිකරණ තීරණ ” වශයෙන් ද හඳුන්වනු ලැබේ.
- තවත් සමහර අවස්ථා වලදී මෙම නීති මූලාශ්‍රයම “පොදු නීතිය” යන නමින්ද හැඳින්වේ.

# <u>අධිකරණ පූර්ව නිදර්ශන න්‍යාය ( Stare Decisis )</u>

මෙරට ඉහල අධිකරණයක් මගින් යම් නෛතික මූලධර්මයක් ස්ථාපිත කල විට, ඉන් පසුව අනාගතයේදී පහල අධිකරණයන් විසින් විසඳනු ලබන සමාන කරුණු සහිත නඩුවකදී ඉහල අධිකරණයන් විසින් ඉන් පෙර ස්ථාපිත කර ඇති එකී නෛතික මූලධර්ම අනුගමනය කිරීමට පහල අධිකරණයන් බැඳී සිටියි. මෙම සිද්ධාන්තය අධිකරණ පූර්ව නිදර්ශන න්‍යාය නම් වේ.

- නඩු තීන්දුවක ප්‍රධාන කොටස් දෙකකි.
  - ➔➔ නඩු තීනිදුවේ හරය ( නඩු තීන්දුවේ වැදගත්ම කොටස )
  - ➔➔ ආගන්තුක ප්‍රකාශය
- පහල අධිකරණයන් බැඳී සිටින්නේ ඉහල අධිකරණ නඩු තීන්දුවේ <u>හරයෙන් පමණි</u>.
- ඒ අනුව සියලු පහල අධිකරණයන් අභියාචනාධිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණ වලින් බැඳී සිටින අතර අභියාචනාධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණ වලින් බැඳී සිටියි.
- ශ්‍රේෂ්ඨාධිකරණය, තමන්ගේම පෙර තීරණ වලින් බැඳී නොමැති අතර එහෙත් එම තීරණ අනුගමනය කිරීම අපේක්ෂා කෙරේ.
- නීතිය පිලිබඳ වඩාත් නිශ්චිත බවක් නිර්මාණය කිරීම මෙම රීතියේ අරමුණ වන අතර එමගින් නීතිය පිලිබඳව පූර්වාපේක්ෂණය කිරීමේ හැකියාවක්ද ඇතිවේ.

# සිරිත්

- මීලඟ වැදලගත් නීති මූලාශ්‍රය වන්නේ සිරිත් ය.
- පනත් වලට හෝ ඉහල අධිකරණ තීරණ වලට යොමු වීම මගින් යම් කාරණාවකට / ගැටලුවකට බලපාන නීතිය සොයා ගැනීමට නොහැකි වුවහොත් එවිට ඊට අදාල වන නීතිය සොයා ගැනීම සඳහා යොමු වන්නේ සිරිතක් වෙතය.
- නමුත් මෙම නීති මූලාශ්‍රය එතරම් සුලභ නොවේ. ධීවර කර්මාන්තයේදී සහ මැණික් ගැරීමේ කර්මාන්තයේදී භාවිතා වන සමහර සිරිත්, නීතිය ලෙස පිලිගැනීමට ( එනම්, එම කර්මාන්ත වලදී භාවිතා වන යම් යම් සිරිත් නීති මූලාශ්‍ර ලෙස පිලිගැනීමට ) මෙරට අධිකරණයන් කටයුතු කල අවස්ථා දක්නට ඇත.
- බහුතර වාණිජ නීති වෙලඳුන්ගේ චාරිත්‍ර වලින් බිහිවූ ඒවාය. ඒවා " වෙලඳුන්ගේ නීති " ලෙස හැඳින්වේ.
- මෙරට අධිකරණයන් විසින් සිරිතක්, නීති මූලාශ්‍රයක් ලෙස පිලිගැනීමට නම් පහත කොන්දේසි සම්පූර්ණ කර තිබිය යුතුය.
  - ❖ එම සිරිත ඉපැරණි විය යුතු අතර දැඩිව ස්ථාපිතව තිබිය යුතුය. එමෙන්ම එය දීර්ඝ කාලයක් අඛණ්ඩව පිලිපැද තිබිය යුතුය.
  - ❖ එය සාධාරණ විය යුතු අතර හොඳින් මුල් බැස ගත් නීති මූලධර්මයන්ට එරෙහි වන්නක් නොවිය යුතුය.
  - ❖ එය නිශ්චිත විය යුතු අතර සිරිතක් වශයෙන් පිලිගැනීමේදී කිසිඳු සැකයක් නොතිබිය යුතුවාක් මෙන්ම එම සිරිත අවභාවිතය හේතුවෙන් අතහැර දමන ලද්දක් නොවිය යුතුය.

# නීතියේ වර්ගීකරණයන්

නීතිය

හරයාත්මක නීතිය | කාර්ය පටිපාටික නීතිය

| පුරවැසියන්ගේ අයිතිවාසිකම්, යුතුකම් සහ වගකීම් සකස් කරන්නාවූ ලිඛිත නීතිය මින් අදහස් කෙරේ. | අයිතිවාසිකම්, යුතුකම් සහ වගකීම් බලාත්මක කිරීම සඳහා වන කාර්ය පටිපාටිය සහ ක්‍රියා මාර්ගයන් නිශ්චිතව දක්වා ඇති නීතියයි. |
|---|---|
| හරයාත්මක නීතිය මගින් නඩුවක ආකෘතිය සහ කරුණු පිලිබඳව සාකච්ඡා කරයි. | නෛතික කටයුත්තක පියවරයන් පිලිබඳව ප්‍රතිපාදනයන් කාර්ය පටිපාටික නීතිය තුල දක්නට ඇත. |
| උදාහරණ - විවිධ පනත් සහ ඉහල අධිකරණ තීරණ තුල දක්නට ඇති නීතිය | උදාහරණ - අපරාධ නඩු විධාන නීතිය, සිවිල් නඩු විධාන නීතිය, සාක්ෂි නීතිය |

## නීතිය

### පොදු නීතිය | පෞද්ගලික නීතිය

| පොදු නීතිය | පෞද්ගලික නීතිය |
|---|---|
| රජය - ජනතාවට අදාල වන නීති<br><br>සමස්තයක් ලෙස රජයට සහ ජනතාවට පොදුවේ බලපාන නීති, ( එනම්, රජය පාර්ශවකරුවෙකු වන නීතීන් ) පොදු නීති නම් වේ. | පුද්ගලයන් - පුද්ගලයන් අතර ආරවුල් / කාරණා වලට අදාල වන නීති<br>එනම්, රජය පාර්ශවකරුවෙකු නොවන නීතීන් පෞද්ගලික නීති නම් වේ. |
| එය රජයේ විෂයන් සමග රජයට ඇති සම්බන්ධතාවයන් තීරණය කරයි. | |
| උදාහරණ - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය<br>පරිපාලන නීතිය<br>අපරාධ නීතිය<br>ජාත්‍යන්තර නීතිය | උදාහරණ - පවුල් නීතිය<br>ගිවිසුම් නීතිය<br>සමාගම් නීතිය<br>වාණිජ නීතිය |

නීතිය

| සිවිල් නීතිය | අපරාධ නීතිය |
| --- | --- |
| පුද්ගලයන්ගේ අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳව සහ එම අයිතිවාසිකම් සහ වගකීම් කඩවීමකදී ඊට ඇති පිලියම් පිළිබඳව සිවිල් නීතියේදී අවධානය යොමු කෙරේ. | අපරාධ නීතියේදී සැලකිලිමත් වන්නේ පුද්ගලයෙකුගෙන් සමාජය වෙත ඇති වගකීම් පෙන්වා දීමටය. |
| පුද්ගලයෙකුට මූල්‍යමය හානියක් සිදු කිරීම සිවිල් වරදකි. | යම් පුද්ගලයෙකුට හෝ ඔහුගේ දේපල වලට පහරදීම අපරාධයකි. |
| සිවිල් නීතියේ අරමුණ හානි පූර්ණය කිරීමයි. | අපරාධ නීතියේ අරමුණ වැරදිකරුට දඬුවම් දීමයි. |
| සිවිල් නීති ප්‍රතිකර්ම වනුයේ වන්දි, තහනම් නියෝග ලබා ගැනීම, ගිවිසුමකදී නම් එලෙසම ඉටුකිරීමේ නියෝග ලබා ගැනීම ආදිය වේ. | අපරාධ නීති ප්‍රතිකර්ම වනුයේ දඩ, සිර දඬුවම්, අත්හිටවූ සිර දඬුවම්, මරණීය දණ්ඩණය පැනවීම ආදිය වේ. |

# නීතිය

## සිවිල් නීතිය

## අපරාධ නීතිය

| පුද්ගලයන් - පුද්ගලයන් අතර ආරවුලකි. | පුද්ගලයන් රජය අතර ආරවුලකි. |
|---|---|
| සිවිල් නඩුවක් පැවරීම සඳහා රජය මැදිහත් වන්නේ නැත. | අපරාධයක් වනාහි එක් පුද්ගලයෙකු විසින් තවත් පුද්ගලයෙකුට එරෙහිව කරනු ලැබූවක් වුවද එහි ඇති සමාජමය බලපෑම සහ බරපතලකම අනුව නීතිය විසින් සලකනු ලබන්නේ එකී වරද මුලු මහත් සමාජයටම හෝ රජයට විරුද්ධව කරනු ලැබූවක් ලෙසය. අපරාධ නඩුවක් බොහෝ අවස්ථා වලදී රජය/රාජ්‍ය ආයතනයක් විසින් පවරනු ලබන්නේ ඒ නිසාය. |
| සිවිල් නඩු ප්‍රධාන වශයෙන් දිසා අධිකරණයෙහි විභාග කෙරේ. | අපරාධ නඩු, මහේස්ත්‍රාත් අධිකරණයෙහි සහ මහාධිකරණයෙහි විභාග කෙරේ. |

# නීතිය

## සිවිල් නීතිය

## අපරාධ නීතිය

| සිවිල් නීතිය | අපරාධ නීතිය |
|---|---|
| පාර්ශවයන් වන්නේ පැමිනිල්ල සහ විත්තියයි. | පාර්ශවයන් වන්නේ පැමිනිල්ල සහ විත්තියයි. වීත්තිකරුට චූදිත යැයි ද කියයි. |
| සිවිල් නඩුවක ඔප්පු කිරීමේ භාරය හෙවත් එම නඩුව අධිකරණයක් හමුවේ ඔප්පු කල යුතු ප්‍රමාණය වන්නේ වැඩිබර සාක්ෂි මත ඔප්පු කිරීමක් හෙවත්, ශක්‍යතා වැඩිබර ඔප්පු කිරීමක් හෙවත්, තුලනාත්මක සම්භාවිතා ඔප්පු කිරීමකි. | අපරාධ නඩුවක ඔප්පු කිරීමේ භාරය වන්නේ සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමකි. |
| උදාහරණ - ඉඩම් නඩු, බෙදුම් නඩු<br>වෛවාහක කාරණා සම්බන්ධ නඩු<br>අනාචාරය, ගිවිසුම් කඩ කිරීම,<br>වන්දි නඩු, කුලවද්දා ගැනීමේ නඩු | උදාහරණ - සොරකම, මංකොල්ලකෑම<br>ස්ත්‍රී දූෂණය, ලිංගික අතවර කිරිම,<br>අපහරණය, බියවැද්දීම, මිනීමැරීම,<br>අයුතු ඇතුලුවීම, අනර්ථය සිදුකිරීම |
| | |

- ■ නීතිය, ව්‍යවස්ථාපිත නීතිය පොදු නීතිය ලෙසටද වර්ග කෙරේ.
- ■ ව්‍යවස්ථාපිත නීතිය යනු පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන පනත් / ව්‍යවස්ථා තුල අන්තරගත වන නීතියයි.
- ■ **<u>පොදු නීතිය යනු ඉහල අධිකරණ තීරණයන්හි අඩංගු නීතියයි.</u>**
  – **<u>ව්‍යවස්ථාපිත නීතිය සහ පොදු නීතිය අතර ගැටුමකදී ව්‍යවස්ථාපිත නීතිය, පොදු නීතිය අභිබවා ඉහලින් සිටියි. ජනතා නියෝජනය සහිත පාර්ලිමේන්තුව උත්තරීතර ලෙස සැලකීම ඊට හේතුවයි.</u>**
- ■■ **<u>ඉතා වැදගත්</u>** - පොදු නීතිය යන යෙදුම විවිධ අවස්ථාවන්හිදී / විවිධ ස්ථානයන්හිදී විවිධ අර්ථයෙන් යෙදේ. එමනිසා එම වචනය ඒ ඒ අවස්ථාවට උචිත පරිදි තේරුම් ගත යුතුය.
- ■ විටකදී පොදු නීතිය යන වචනය, ඉහල අධිකරණ තීරණ නීතිය හැඳින්වීම සඳහාද, තවත් අවස්ථාවකදී රෝම ලන්දේසි නීතිය හැඳින්වීම සඳහාද, තවත් අවස්ථාවකදී රජය පාර්ශවයක් වන නීතීන් හැඳින්වීම සඳහාද, තවත් අවස්ථාවකදී ඉංග්‍රීසි පොදු නීති සාම්ප්‍රදාය හැඳින්වීම සඳහාද, යෙදේ.
- ■ මෙරට පොදු නීතිය කුමක්ද යන පැනයට ඍජු නිශ්චිත පිලිතුර වනුයේ රෝම ලන්දේසි නීතිය යන්නයි.

## නඩුවක පාර්ශවකරුවෝ

✡✡ සිවිල් නඩුවක කාර්ය පටිපාටිය ආකාර දෙකකි. ඒ සාමාන්‍ය කාර්ය පටිපාටිය සහ ලඝු කාර්ය පටිපාටිය ලෙසය.

✡✡ සාමාන්‍ය කාර්ය පටිපාටිය අනුගමනය කරනු ලබන සිවිල් නඩුවක පාර්ශවයන් වන්නේ පැමිනිලිකාර පාර්ශවය / පැමිනිල්ල සහ විත්තිකාර පාර්ශවය / විත්තියයි.

✡✡ අධිකරණයක් හමුවේ නඩුවක් ගොනු කරනු ලබන පාර්ශවය හෙවත් නඩු දමන පාර්ශවය පැමිනිලිකාර පාර්ශවය / පැමිනිල්ල ලෙසත්,

✡✡ එලෙස නඩු පැවරීමට යටත් වන පාර්ශවය විත්තිකාර පාර්ශවය / විත්තිය ලෙසත් හැඳින්වේ.

✡✡ ලඝු කාර්ය පටිපාටිය අනුගමනය කරනු ලබන සිවිල් නඩුවක පාර්ශවයන් වන්නේ පෙත්සම්කාර පාර්ශවය / පෙත්සම්කරු සහ වගඋත්තරකාර පාර්ශවය / වගඋත්තරකරු ලෙසත්ය.

✡✡ අපරාධ නඩුවක පාර්ශවයන් වන්නේ පැමිනිලිකාර පාර්ශවය / පැමිනිල්ල සහ විත්තිකාර පාර්ශවය / විත්තියයි. විත්තිකරුට එරෙහිව චෝදනා ගොනු කල පසු විත්තිකරු සඳහා චූදිත යන වචනයද භාවිතා කෙරේ.

✡✡ අපරාධයක් සිදු කරනු ලැබූයේ යම් පාර්ශවයකට විරුද්ධවද, එම පාර්ශවය වින්දිත පාර්ශවය ලෙස හෝ අගතියට පත් පාර්ශවය ලෙස හැඳින්වේ.

# නඩු තීන්දුවක් ලියන ආකාරය

- පහත ක්‍රම වලින් ඕනෑම ක්‍රමයකට නඩු තීන්දුවක් ලිවිය හැකිය.
  - පැමිනිල්ල එරෙහිව විත්තිය
  - පැමිනිල්ල එදිරිව විත්තිය
  - පැමිනිල්ල එ. විත්තිය
  - පැමිනිල්ල Vs විත්තිය

උදාහරණ - කමල් එරෙහිව නිමල්

කමල් එදිරිව නිමල්

කමල් එ. නිමල්

Kamal Vs Nimal

# නීතියේ ආධිපත්‍යය

- මෙරට සම්පූර්ණ නීති පද්ධතියම නීතියේ ආධිපත්‍යය නැමැති සංකල්පය මත පදනම්ව ඇත.
- නීතියේ ආධිපත්‍යය නැමැති සංකල්පයේ ප්‍රධාන අංග හතරකි. එනම්,
- ⌘ නීතිය උත්තරීතර වන අතර හිතුවක්කාරී බලයට සමාජයේ තැනක් නැත.
- ⌘ සියලු පුරවැසියන් නීතිය ඉදිරියේ සමානය.
- ⌘ පුරවැසියන්ගේ අයිතිවාසිකම් අධිකරණය මගින් බලාත්මක කල හැකිය.
- ⌘ විධිමත් අධිකරණ ක්‍රියාවලියකින් මිස කිසිම තැනැත්තෙකු වරදකරුවෙකු කිරීමට හෝ වගකීම් පැවරීමට නොහැක.

# ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය

- මෙරට නීති පද්ධතිය සමන්විත වන අංග පහත පරිදි වේ.

- ☠☠ ව්‍යවස්ථාපිත නීතිය
- ☠☠ ඉහල අධිකරණ තීරණ
- ☠☠ අධිකරණය විසින් පිලිගත් චාරිත්‍ර
- ☠☠ රෝම ලන්දේසි නීතිය
- ☠☠ ඉංග්‍රීසි නීතිය
- ☠☠ බෞද්ධාගමික නීතිය
- ☠☠ හින්දු ආගමික නීතිය
- ☠☠ උඩරට නීතිය, තේසවලාමෙයි නීතිය, මුස්ලිම් නීතිය වැනි පුද්ගලික නීති

# රෝම ලන්දේසි නීතිය

- ලන්දේසින් විසින් මෙරට පාලනය කරන අවධියේදී ඔවුන් විසින් මෙරටට රෝම ලන්දේසි නීතිය හඳුන්වා දෙනු ලැබීය.
- රෝම ලන්දේසි නීතිය මෙරට පොදු නීතිය ලෙස හැඳින්වේ. එය එලෙස හැඳින්වීමට හේතුව වන්නේ උඩරට නීතිය වැනි විශේෂ පුද්ගල නීති වලින් පාලනය වන තැනැත්තන්ට හැර මෙරට වෙසෙන සෙසු සියලු දෙනාට පොදුවේ අදාල වන නිසාය.

- රෝම ලන්දේසි නීතිය මෙරට ශේෂ නීතිය ලෙසද හැඳින්වේ. එය එලෙස හැඳින්වීමට හේතුව වන්නේ යම් නිශ්චිත සිදුවීමකට / කරුණකට අදාල වන නීතිය තුල එම කරුණ පිලිබඳව කිසිඳු සඳහනක් නොමැති විට ( එනම්, එම කරුණට අදාලව, එම නීතිය නිහඬ වන විට ) හෝ එම කරුණ සඳහා එම නීතිය යොදා ගත නොහැකි වන විට දී එම කරුණ විසඳීම සඳහා රෝම ලන්දේසි නීතිය යොදා ගන්නා බැවිනි.

- මෙරට නඩු තීන්දු නීතිය මගින් ශ්‍රී ලංකාව තුල රෝම ලන්දේසි නීතියෙහි අදාලත්වය පිලිබඳව තීරණය කර ඇත.
- ඊට උදාහරණ කිහිපයක් පහත පරිදි වේ.

# මෙරට තුල රෝම ලන්දේසි නීතියේ අදාලත්වයට අදාල නඩු තීන්දු

- <u>සිල්වා එරෙහිව ජොහානිස් අප්පුහාමි</u>

  සමස්ත රෝම ලන්දේසි නීතියම මෙරටට අදාල නොවේ. එය අදාල වන්නේ අපගේ අවස්ථාපිත සාධකයන්ට යෝග්‍ය වන ප්‍රමාණයට පමණි.

  <u>මුත්තයියා ජයරාජන් එරෙහිව තුෂියන්ති ජයරාජන් සහ තවත් අය</u>

  නූතන නීති සංකල්ප වලට අනුකූල රෝම ලන්දේසි නීති මූලධර්ම පමණක් අධිකරණය විසින් යොදා ගනියි.

  <u>කොරොස්ස රබර් කම්පනි එරෙහිව සිල්වා</u>

  රෝම ලන්දේසි නීතිය පිරිසිදු සහ සරල වේ. ශ්‍රී ලංකාව තුල රෝම ලන්දේසි නීතිය යොදා ගැනීම බොහෝ ක්ෂේත්‍රයන්හි ව්‍යවස්ථාපිත නීතිය සහ නඩු තීන්දු මගින් නවීකරණය කර ඇත. සම්පූර්ණ රෝම ලන්දේසි නීතියම මේ රටෙහි නොපවතී.

# <u>මෙරටදී රෝම ලන්දේසි නීති ආභාෂය ලැබූ ක්ෂේත්‍ර</u>

- දිලික්ත නීතිය
- දේපල නීතිය
- වෛවාහක කාරණා පිලිබඳ නීතිය
- රක්ෂණ නීතිය තුල හදිසි අනතුරු රක්ෂණය

# <u>ශ්‍රී ලංකාව තුල ඉංග්‍රීසි නීතියේ අදාලත්වය</u>

- ඉංග්‍රීසි නීතිය මෙරටට හඳුන්වා දෙන් ලැබුයේ ඉංග්‍රිසින් විසිනි.
- පාර්ලිමේන්තු පනත් සහ ඉහල අධිකරණ තීරණ මාර්ගයෙන් ඉංග්‍රීසි නීතිට මෙරට නීති පද්ධතියට එක් විය.
- ඉංග්‍රීසීන් විසින් මෙරට පාලන බලය අත්පත් කරගැනීමෙන් පසුව එතෙක් මෙරට පැවති සමස්ත නීති පද්ධතිය සඳහාම ඉංග්‍රීසි නීතිය ආදේශ නොකල අතර, ශ්‍රී ලංකාව පමණක් නොව ඔවුන්ගේ සෙසු යටත් විජිත වලද නීතිය යාවත්කාලීන වී නොමැත්තේ නම් පමණක් ඒ සඳහා ඉංග්‍රීසි නීතිය අදාල කර ගන්නා ලදී. ඒ සම්බන්ධයෙන් පහත නඩු තීන්දුව අතිශය වැදගත්ය.
- <u>කැම්බෙල් එරෙහිව හෝල්</u>

  ඉංග්‍රීසීන් විසින් යටත් කර ගන්නා ලද අවස්ථාවේදී ඒ ඒ යටත් විජිතයේ පැවති නීති, බිඳ දැමීමකින් තොරව අඛණ්ඩව ඒ ඒ යටත් විජිතයේ අදාල පුද්ගලයන්ට සහ දේපල වලට අදාල විය යුතුය.

අපගේ ව්‍යාපාර නීතිය විෂය මාලාවේ බොහෝ පාඩම් ද ඉංග්‍රීසි නීතිය මත පදනම් වූ මාතෘකාවන් වෙයි.

## මෙරටදී ඉංග්‍රීසි නීති ආභාෂය ලැබූ ක්ෂේත්‍ර

- භාණ්ඩ විකිණීමේ නීතිය
- බැංකු නීතිය
- නියෝජ්‍යත්ව නීතිය
- හවුල් ව්‍යාපාර නීතිය
- සමාගම් නීතිය
- කුලී සින්නක්කර නීතිය
- ගනුදෙනු තලහැකි ලියවිලි පිලිබඳ නීතිය
- බුද්ධිමය දේපල පිලිබඳ නීතිය
- බොහෝමයක් රක්ෂණ නීතීන්

# පුද්ගල නීති

- පුද්ගල නීතියක් යනු යම් විශේෂිත ජන වර්ගයකට / පුද්ගල කොට්ඨාශයකට අදාල වන නීතීන් වේ.

- මෙරට තුල ක්‍රියාත්මක වන ප්‍රධාන පුද්ගල නීතින් තුනකි.
  - ☐ උඩරට නීතිය
  - ☐ තේසවලාමෙයි නීතිය
  - ☐ මුස්ලිම් නීතිය

- යම් පුද්ගල නීතියකින් පාලනය වන අයෙකුට, යම් සිදුවීමකට / කාරණාවකට අදාලව තමා පාලනය විය යුත්තේ එම කාරණාවට අදාල පුද්ගල නීතියෙන්ද එසේත් නැතිනම් රටේ සාමාන්‍ය නීතියෙන්ද යන්න තීරණය කිරීමේ අභිමතයක් ඇත.
- යම් සිදුවීමකට / කාරණාවකට අදාල පුද්ගල නීතිය තුල එකී කාරණාව සම්බන්ධයෙන් ප්‍රතිපාදන නොමැති නම් හෝ අදාල පුද්ගල නීතිය, එකී කාරණාව සම්බන්ධයෙන් නිහඬ වන විට එම කාරණාව විසඳීම සඳහා ශේෂ නීතිය ලෙස රෝම ලන්දේසි නීතිය යොදා ගනී.

# ප්‍රාදේශීය නීති

☒ ප්‍රාදේශීය නීති යනු යම්කිසි ප්‍රාදේශීය පදනමක් මත ක්‍රියාත්මක වන නීතීන් වේ. එනම් යම් නිශ්චිත ප්‍රදේශයක් මුල් කර ගෙන ක්‍රියාත්මක වන නීතීන් වේ.

☒ ප්‍රාදේශීය නීතියක් සඳහා වන හොඳම උදාහරණය වන්නේ තේසවලාමෙයි නීතියයි.

☒ තවද මුස්ලිම් නීතිය කිසිසේත්ම ප්‍රාදේශීය නීතියක් නොවේ.

# උඩරට නීතිය

- උඩරට නීතිය යනු උඩරට සිංහල නම් සිංහල ප්‍රජාවේ නිශ්චිත ජන වර්ගයකට අදාල වන්නාවූ පුද්ගල නීතියකි.

- උඩරට සිංහලයන් ලෙස සලකණු ලබන්නේ බ්‍රිතාන්‍යයන් විසින් කන්ද උඩරට රාජධානිය ආක්‍රමණය කිරීමට පෙර එනම්, ක්‍රි.ව. 1815 ට පෙර උඩරට පලාතෙහි ස්ථිර පදිංචිය හිමිව සිටි අයෙක් හෝ එවැන්නෙකුගෙන් පැවත එන්නෙකු වේ.

- උඩරට පලාත යන්නට මධ්‍යම පලාත සහ සබරගමු පලාත, ඌව පලාත, උතුරුමැද පලාත යන පලාත් වල සමහර ප්‍රදේශ අදාල වේ.

- උඩරට නීති ප්‍රධාන වශයෙන් මූලධර්ම දෙකක් මත පදනම්ව ඇත. ඒවා නම්,
  - ❁ එකම පවුල තුල දේපල රැකගැනීමේ අභිප්‍රාය.
  - ❁❁ විවාහය මත හෝ කුලවද්දා ගැනීම මත පවුලට සම්බන්ධ වූ සාමාජිකයන්ටද පවුලේ ප්‍රතිලාභ හිමිකර දීම.

# උඩරට නීතියට අදාල වැදගත් නඩු තීන්දු

- වර්ෂ 1815 දී බ්‍රිතාන්‍යයන් විසින් කන්ද උඩරට රාජධානිය අත්පත් කරගත් පසුව උඩරට ප්‍රදේශ වල පදිංචි වූ බ්‍රිතාන්‍ය පදිංචිකරුවන්ට , එතෙක් එම පලාත තුල ක්‍රියාත්මක වූ උඩරට නීතිය අදාල නොවීය. එහෙත් ස්වදේශීය පදිංචිකරුවන් සඳහා උඩරට නීතිය දිගටම අදාල විය.
- කර්ෂො එරෙහිව නිකොල්
- උඩරට ස්ථිර පදිංචිය හිමි විදේශීය කාන්තාවකට උඩරට නීතිය අදාල වන බව තීරණය විය.

- එහෙත් පසුව මෙම නඩුව, පහත සඳහන් විලියම්ස් එරෙහිව රොබට්සන් නඩු තීන්දුව මගින් අධිතීරණය කරන ලදී.
- විලියම්ස් එරෙහිව රොබට්සන්

  උඩරට ස්ථිර පදිංචිය හිමි විදේශීය තැනැත්තෙකුට උඩරට නීතිය අදාල නොවන බව තීරණය විය.
- ඒ අනුව වර්තමාන නෛතික තත්වය විලියම්ස් එරෙහිව රොබට්සන් නඩුතීන්දුව පරිදි වේ.

# තේසවලාමෙයි නීතිය

- උතුරු පලාතේ ස්ථිර පදිංචිය හිමි ද්‍රවිඩ භාෂාව කථාකරන මලබාර් වැසියන්ට අදාල වන පුද්ගල නීතියකි.
- ලන්දේසීන් විසින් තේසවලාමෙයි නීතිය, සංග්‍රහගත කරන ලද අතර එය තේසවලාමෙයි නීති සංග්‍රහය ලෙස හැඳුන්වේ.

- තේසවලාමෙයි නීතියට අදාල ප්‍රධාන අංග දෙකකි.
  - ⌘ පුද්ගල නීතියක් වශයෙන් තේසවලාමෙයි නීතිය, පුද්ගල නීතියක් වශයෙන් යාපනය පලාතේ ( වර්තමාන උතුරු පලාතේ ) පදිංචි සියලුම මලබාර් වැසියන්ට ( සියලුම ද්‍රවිඩ වැසියන්ට ) අදාල වීම.
  - ⌘ ප්‍රාදේශීය නීතියක් වශයෙන්, අයිතිකරුගේ ජනවර්ගය හෝ පදිංචි ප්‍රදේශය නොසලකා, උතුරු පලාතේ පිහිටා ඇති සියලුම ඉඩම් වලට තේසවලාමෙයි නීතිය අදාල වේ.

❄ ප්‍රාදේශීය නීතියක් සඳහා වන හොඳම උදාහරණය වන්නේ තේසවලාමෙයි නීතියයි.

# තේසවලාමෙයි නීතියට අදාල වැදගත් නඩු තීන්දු

- <u>චෙට්ටි එරෙහිව චෙට්ටි</u>

  " මලබාර් " යන යෙදුම, ද්‍රවිඩ යන යෙදුමට සමානාර්ථ පදයක් බවත් යාපනයේ සියලුම දෙමල වැසියන්ට තේසවලාමෙයි නීති සංග්‍රහය අදාල වන බවත් තීරණය විය.

  <u>ධර්මලිංගම් චෙට්ටි එරෙහිව අරුණාචලම් චෙට්ටි</u>

  උතුරු පලාතේ ජීවත් වන සියලුම ද්‍රවිඩ ජනතාවට තේසවලාමෙයි නීති සංග්‍රහය අදාල වන බව තීරණය විය.

  <u>සභාපතිපිල්ලේ එරෙහිව සින්නතම්බි</u>

  යම් කාරණාවකට අදාලව තේසවලාමෙයි නීතිය නිහඬ වන අවස්ථාවකදී ඒ කාරණාව විසඳීම සඳහා රෝම ලන්දේසි නීතිය අදාල වේ.

# තේසවලාමෙයි නීතියට අදාල වෙනත් වැදගත් කරුණු

- ☺ උතුරු පලාතේ පිහිටා ඇති ඉඩමක හිමිකරු කුමන ජන වර්ගයකට අයත් වුවද, ශ්‍රී ලංකාව තුල කුමන ප්‍රදේශයක පදිංචි වුවද එම කාරණා නොසලකා උතුරු පලාතේ පිහිටා ඇති සියලු ඉඩම් සම්බන්ධයෙන් තේසවලාමෙයි නීතිය අදාල වේ.

- ☺ තේසවලාමෙයි නීතියෙන් පාලනය වන පුරුෂයන්ගේ භාර්යාවන්ටද තේසවලාමෙයි නීතිය අදාල වෙයි.

- ☺ තේසවලාමෙයි නීතියට යටත් කාන්තාවක්, තේසවලාමෙයි නීතියට යටත් නොවන පුරුෂයෙකු සමග විවාහ වුවහොත්, එකී විවාහයෙන් පසුව එම කාන්තාවට තේසවලාමෙයි නීතිය අදාල වීම ( එනම්, ඇය තේසවලාමෙයි නීතියට යටත් වීම ) අවසන් වේ.

- ☺☺☺ ස්වකීය ස්වාමි පුරුෂයාගේ කැමැත්ත සහ අවසරයකින් තොරව ගිවිසුම් වලට එලඹීමට තේසවලාමෙයි නීතියට යටත් භාර්යාවකට නොහැකිය. 💣💣💣

# මුස්ලිම් නීතිය

- ☪☪☪ ඉස්ලාම් ධර්මය අදහනු ලබන සියලුම දෙනාට මුස්ලිම් නීතිය අදාල වේ. ☪☪☪

- මෙරට තුල මුස්ලිම් නීති මූලාශ්‍ර පහත පරිදි වේ.

☪ ව්‍යවස්ථාපිත නීතිය

⇨ මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත

☪ මොහොම්මදික සංග්‍රහය

☪ ඓතිහාසික මූලාශ්‍ර

⇨ කුරාණය

☪ වෙනත් අතිරේක මූලාශ්‍ර

☪☪☪ සුන්නි නිකාය සහ ෂියා නිකාය යනුවෙන් මුස්ලිම් ආගම තුල නිකායයන් දෙකක් දක්නට ඇතත් මෙරට අධිකරණයන් තීරණය කර ඇත්තේ ශ්‍රී ලංකාවේ අදාල වන්නේ සුන්නි නිකායට අයත් මුස්ලිම් නීතිය වන බවයි.

# බෞද්ධාගමික නීතිය

- බෞද්ධ සංඝයා වහන්සේලා විවිධ විනය නීති වලින් පාලනය වෙති. එම විනය නීති, බෞද්ධාගමික නීතිය ලෙස හැඳින්වේ.
- එම විනය නීති උන්වහන්සේලාගේ සිවිල් අයිතිවාසිකම් සහ දේපල අයිතිවාසිකම් වලට අදාල කරුණු නියාමනය කෙරේ.

- උදාහරණ - ⚐ නායක හිමි නමක් වූ විට අනුප්‍රාප්ති පිලිවෙල
  ⚐ පැවිදි දිවියට ඇතුලත් කර ගැනීම සඳහා වන සුදුසුකම්

- එම විනය නීති, චාරිත්‍රයක් ලෙස අධිකරණය හමුවේ ඔප්පු කරනු ලැබුවහොත් එය නීති මූලාශ්‍රයක් ලෙස අදාල කරුණු පිලිබඳව තීරණය කිරීමේදි අධිකරණයන් විසින් යොදා ගනු ඇත.
- 1931 බෞද්ධ විහාර හා දේවාලගම් ආඥා පනත මෙරට බෞද්ධ විහාරස්ථාන හා දේවාලයන්ට අදාල ප්‍රධානතම පනතකි.

# ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය

❁ අපගේ උත්තරීතර නීතියෙහි 3 , 4 වන ව්‍යවස්ථාවන් තුල ජනතා පරමාධිපත්‍යය පිලිබඳ කරුණු අන්තර්ගත වන අතර, ජනතා පරමාධිපත්‍යයේ අංගයක් වන ජනතාව ගේ අධිකරණ බලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ වෙනත් යම් නීතියක් මගින් ඇති කොට පිහිටවන ලද අධිකරණ, විනිශ්චය අධිකාර සහ ආයතන මගින්, පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කල යුතු බව දක්වා ඇත.

❁ ඒ අනුව මෙරට අධිකර්ණ පද්ධතිය පිහිටුවීම සඳහා පහත නීතීන් මගින් ප්‍රතිපාදන සපයා ඇත.

- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- 1978 අංක 2 දරණ අධිකරණ සංවිධාන පනත
- පලාත්බද මහාධිකරණ පනත
- පලාත්බද මහාධිකරණ ( විශේෂ විධිවිධාන ) පනත

# මහේස්ත්‍රාත් අධිකරණය ( Magistrate Court )

- අධිකරණ සංවිධාන පනත අනුව සෑම අධිකරණ කලාපයක් සඳහාම මහේස්ත්‍රාත් අධිකරණයක් පිහිටා ඇත.
- මෙහි විනිසුරුතුමා මහේස්ත්‍රාත් ලෙස හඳුන්වනු ලැබේ.
- මහේස්ත්‍රාත් අධිකරණයට පහත ආකාරයේ නඩු කටයුතු විභාග කිරීමට අධිකරණ බලය ඇත.
  - නඩත්තු නඩු
  - අපරාධ නඩු විධාන සංග්‍රහයේ 98 වන වගන්තිය ප්‍රකාර මහජන පීඩා නඩුකර
  - දණ්ඩ නීති සංග්‍රහය යටතේ වන සමහර වැරදි උදා - සොරකම, මංකොල්ලකෑම, සුලු තුවාල සිදුකිරීම, බරපතල තුවාල සිදු කිරීම
  - ලඝු නොවන පරීක්ෂණ පැවැත්වීම ( මිනීමැරීම, මිනීමැරීමට තැත් කිරීම, ස්ත්‍රී දුෂණය යන වැරදි සඳහා මහාධිකරණයේ නඩු පැවරීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි තිබේදැයි බැලීමට මහේස්ත්‍රාත් අධිකරණයේදී පවත්වනු ලබන පරීක්ෂණය )
  - යම් නීතියක් මගින් මහේස්ත්‍රාත් අධිකරණයට අධිකරණ බලය ඇතැයි සඳහන් කර ඇති වැරදි

- ගෘහස්ත ප්‍රචණ්ඩ ක්‍රියා වැලැක්වීමේ පනත යටතේ වන නඩු
- රථ වාහන වැරදි ( මෝටර් රථ වාහන පනත යටතේ වන නඩු )
- අධිකරණය පිලිබඳව සඳහන් නොවුවද දෙවසරකට නොවැඩි බන්ධනාගාරගත කිරීමකින් සහ රුපියල් එක්දහස් පන්සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කල හැකි සියලු වැරදි

මීට අමතරව සැකකටයුතු මලසිරුරු පරීක්ෂාකොට අවශ්‍ය විධාන නිකුත් කිරීම සහ හඳුනාගැනීමේ පෙරෙට්ටු පැවැත්වීමේ බලතලද මහේස්ත්‍රාත් අධිකරණය සතුය.

# දිසා අධිකරණය / දිස්ත්‍රික් අධිකරණය ( District Coiurt )

- සිවිල් ස්වභාවයේ නඩු පමණක් දිසා අධිකරණයෙහි විභාග කෙරේ.
- මෙහි විනිශ්චයකාරතුමා දිසා විනිසුරු ලෙස හැඳින්වේ.
- මෙම අධිකරණය, අධිකරණ සංවිධාන පනත මගින් පිහිටුවා ඇත.
- සෑම අධිකරණ කලාපයකටම දිසා අධිකරණ එකක් හෝ කිහිපයක් පිහිටා ඇත.
- එක් එක් දිසා අධිකරණයේ අධිකරණ බලසීමාව අභියාචනාධිකරණ සභාපතිතුමාගෙන් සහ අග්‍රවිනිශ්චයකාරතුමාගෙන් විමසීමෙන් පසුව අධිකරණ ඇමති විසින් තීරණය කල යුතුය.
- දිසා අධිකරණයට පහත ආකාරයේ නඩු විභාග කල හැකිය.
  - 🏆 වස්තු භංගත්ව නඩු
  - 🏆 ඉඩම් නඩු
  - 🏆 බෙදුම් නඩු
  - 🏆 දික්කසාද නඩු
  - 🏆 විවාහ ශූනතා නඩු
  - 🏆 කුලවැද්දුම් නඩු
  - 🏆 ලමුන්ගේ භාරකාරත්වය පිලිබඳ කාරණා ( බාලවයස්කරුවකුගේ ඉහලම භාරකරු වන්නේ දිසා අධිකරණයයි)

# මහාධිකරණය ( High Court )

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මෙම අධිකරණය පිහිටුවා ඇත.
- මෙමගින් මුල් අවස්ථා අපරාධ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලැබේ.
- මෙරට ඉහලතම මුල් අවස්ථා අධිකරණය මෙයයි.
- 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සෑම පලාතක් සඳහාම පලාත්බද මහාධිකරණ පිහිටුවා ඇත.
- පලාත්බද මහාධිකරණයන් මගින් මහේස්ත්‍රාත් අධිකරණ සහ කම්කරු විනිශ්චය සභා තීන්දු සහ නියෝග සම්බන්ධයෙන් අභියාචනා සහ ප්‍රතිශෝධන අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම ඇතුලු තවත් බලතල ක්‍රියාත්මක කරනු ලැබේ.
- වර්තමානයේදී සෑම මහාධිකරණයක්ම පලාත්බද මහාධිකරණයක් ලෙස ක්‍රියාත්මක වේ.
- මීට අමතරව සිවිල් නඩු කටයුතු සම්බන්ධව අභියාචනා සහ ප්‍රතිශෝධන බලතල ක්‍රියාත්මක කිරීම ඇතුලු බලතල සිවිල් අභියාචනා මහාධිකරණය මගින් ක්‍රියාත්මක කෙරේ.
- තවද සමහර තෝරාගත් වාණිජ ආරවුල් සමහරක් විභාග කිරීම සඳහා වාණිජ මහාධිකරණය පිහිටුවා ඇත.

# පලාත්බද මහාධිකරණය ( Provincial High Court )

- පහත සඳහන් කාරණා පලාත්බද මහාධිකරණයේදී විභාග කෙරේ.

- ✸ අදාල පලාත තුල සිදුකර ඇතැයි සැලකෙන වරදවල් සම්බන්ධයෙන් මහාධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලබන මුල් අවස්ථා අධිකරණ බලය යටතේ විභාග වන නඩු

  උදාහරණ - මිනීමැරීම, මිනීමැරීමට තැත් කිරීම, ස්ත්‍රී දූෂණය, මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම, උද්ර්පන නඩු, නාවික කටයුතු සම්බන්ධයෙන් වන අද්මිරාල්ති නඩු, අල්ලස් වැරදි ආදිය

  ✸ මහේස්ත්‍රාත් අධිකරණ සහ කම්කරු විනිශ්චය සභා වල තීන්දු සහ නියෝග වලට එරෙහිව අභියාචනා සහ ප්‍රතිශෝධන අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම.

  ✸ පලාත් සභා ලැයිස්තුවේ දක්වා ඇති කාරණා සම්බන්ධයෙන් අදාල පලාත තුල පමණක් ක්‍රියාත්මක වන පරිදි රිට් ආඥා නිකුත් කිරීමේ බලය.

  ✸ පාර්ලිමේන්තුව විසින් බලය ලබා දී ඇති වෙනත් කාරණා විභාග කිරීම.

# වාණිජ මහාධිකරණය ( Commercial High Court )

- මෙම අධිකරණය පිහිටුවනු ලැබුයේ 1996 අංක 10 දරණ පලාත්බද මහාධිකරණ ( විශේෂ විධිවිධාන ) පනත මගිනි. වාණිජ ආරවුල් කඩිනමින් විසඳීමේ අරමුණින් මෙම අධිකරණය පිහිටුවනු ලැබීය. දැනට බස්නාහිර පලාත තුල පමණක් වාණිජ මහාධිකරණය ක්‍රියාත්මක වේ. ( කොළඹදී )
- පහත සඳහන් කාරණා වාණිජ මහාධිකරණයේදී විභාග කෙරේ.

  - පැමිනිල්ලේ හිමිකම් පෑම මත රුපියල් මිලියන 20 ට වඩා වැඩි වාණිජ ආරවුල්

  ( ආනයන, අපනයන, නැව් කුලී, රක්ෂණ කටයුතු, බැංකු කටයුතු, ණය හෝ අලාභ, නියෝජ්‍යත්ව ගිවිසුම් ආදී ක්ෂේත්‍ර වලින් පැන නගින වාණිජ ආරවුල් )

  - සමාගම් පනත යටතේ සමහර නඩු කටයුතු
  - බුද්ධිමය දේපල පනත යටතේ වන නඩු

⏭⏭ 1990 අංක 2 දරණ ණය ආපසු අයකර ගැනීමේ පනත යටතේ පවරනු ලබන නඩු කටයුතු විභාග කිරීමට වාණිජ මහාධිකරණයට බලය නැත. ⏮⏮

🎗🎗 වාණිජ මහාධිකරණ තීරණයන්ට එරෙහිව අභියාචනා කල යුත්තේ ශ්‍රේෂ්ඨාධිකරණයටය.

# කම්කරු විනිශ්චය සභාව ( Labour Tribunal )

- කම්කරු විනිශ්චය සභා පිහිටුවනු ලැබූයේ කාර්මික ආරවුල් පනත මගිනි.
- මෙහි විනිසුරු තුමා කම්කරු විනිශ්චය සභා සභාපති ලෙස හැඳින්වෙන අතර එතුමාට අතිරේක මහේස්ත්‍රාත් වරයෙකුගේ බලතල හිමිය. ඔහුගේ පත්කිරීම සිදු කරනු ලබන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාව විසිනි.
- මෙය මෙරට අධිකරණ ධූරාවලියට අයත් අධිකරණයක් නොවූවද අධිකරණමය ස්වභාවයෙන් කටයුතු කරනු ලබන විනිශ්චය සභාවකි.
- සේවකයකුට හෝ සේවකයකු වෙනුවෙන් එම සේවකයා අයත් වෘත්තීය සමිතියකට මෙම විනිශ්චය සභාව හමුවේ ඉල්ලීමක් කිරීමට ( නඩු පැවරීමට ) අයිතිය ඇත.
- එහෙත් මෙම විනිශ්චය අධිකාරිය වෙතින් සහනයක් ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කිරීමට ( නඩු පැවරීමට ) රජයේ සේවකයෙකුට හැකියාවක් නැත.
- යුක්තිය ඉෂ්ට කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී අණපනත් වලින් ඔබ්බට පවා ගොස් සාධාරණ සහ යුක්ති සහගත ආකාරයේ නියෝග හෝ තීන්දු ලබා දීමේ බලය කම්කරු විනිශ්චය සභාව සතුය.

– කම්කරු විනිශ්චය සභාව විසින් පහත ආකාරයේ ඉල්ලීම් සලකා බලනු ලැබේ.

– ( කම්කරු විනිශ්චය සභාවට විභාග කල හැකි නඩු වර්ග )

– 〃 〃 අසාධාරණ ලෙස සේවය අවසන් කිරීම් පිලිබඳ ඉල්ලීම්

– 〃 〃 පාරිතෝෂිත ගෙවීම් නොකිරීම පිලිබඳ ආරවුල්

– 〃 〃 යලි සේවයේ පිහිටුවීම සහ සේවා කොන්දේසි වලට අදාල කරුණු

# අභියාචනාධිකරණය ( Court of Appeal )

- මෙය මෙරට දෙවන ඉහලතම අධිකරණය වන අතර අභියාචනාධිකරණය පිහිටුවා ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.

- මහාධිකරණය සහ ඊට පහල අධිකරණයන් වල අභියාචනා සහ ප්‍රතිශෝධන ඉල්ලීම් විභාග කිරීම සම්බන්ධයෙන් අධිකරණ බලය අභියාචනාධිකරණය වෙත ඇති අතර, අභියාචනාධිකරණයේ තීරණයකට හෝ නියෝගයකට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් කල හැකිය.

- අභියාචනාධිකරණය විනිසුරු මණ්ඩලයකින් සමන්විත වන අතර අභියාචනාධිකරණයේ සංයුතිය වන්නේ විනිසුරුවරුන් 6 දෙනෙකුට නොඅඩු සහ  දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් විය යුතු බවට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රතිපාදන සපයා ඇත. මෙහි ප්‍රධානියා අභියාචනාධිකරණ සභාපති විනිසුරු නම් වේ.

- එකවිට වෙන් වෙන්ව නඩු කිහිපයක් විභාග කිරීමේ අවකාශය අභියාචනාධිකරණයට ඇත. තවද ආරවුලේ ස්වභාවය අනුව එය විභාග කිරීම සඳහා සිටිය යුතු විනිසුරුතුමන්ලාගේ සංඛ්‍යාව එකිනෙකට වෙනස් ය.

පහත සඳහන් කාරණා අභියාචනාධිකරණයේදී විභාග කෙරේ.

- මුල් අවස්ථා අධිකරණ බලය ක්‍රියාත්මක කරන්නාවූ මහාධිකරණයේ අභියාචනා සහ ප්‍රතිශෝධන ඉල්ලීම් විභාග කිරීම.
- මුල් අවස්ථා අධිකරණයක වාර්තා පරීක්ෂා කිරීමේ අධිකරණ බලය ( සිය මෙහෙයවීමෙන්ම හෝ යම් ඉල්ලීමක් මත )
- ඇතැම් කරුණු සම්බන්ධයෙන් රිට් ආඥා නිකුත් කිරීමේ බලය -

  - රිට් ආඥා යනු පරිපාලන නීති ප්‍රතිකර්මයන්ය. ඒ අනුව සර්ෂියෝරාරි, ප්‍රොහිබිෂන්, මැන්ඩාමූස්, ප්‍රොසිඩෙන්ඩෝ, ක්වෝ වොරන්ටෝ සහ හේබියස් කෝපුස් රිට් ආඥා නිකුත් කිරීමට අභියාචනාධිකරණයට බලය ඇත.
- පාර්ලිමේන්තු මැතිවරණ ඡන්ද පෙත්සම් විභාග කිරීම.
- ඉන්ජන්ෂන් ආඥා ( තහනම් නියෝග ) නිකුත් කිරීමේ බලය.
- පාර්ලිමේන්තු පනත් අර්ථ නිරූපනය කිරීමේ බලය.
- නඩු මාරු කිරීමේ බලය.
- ඇතැම් වැරදි සඳහා සැකකරුවන්ට ඇප ලබා දීමේ බලය.
- සිරකරුවන් නඩු විභාග වලට ඉදිරිපත් කරන ලෙස නියම කිරීමේ බලය.

# අභියාචනාධිකරණය විසින් රිට් ආඥා නිකුත් කිරීම

- 🛠 පෙර සඳහන් කල ආකාරයට රිට් ආඥා යනු පරිපාලන නීති ප්‍රතිකර්මයන්ය.
- 🛠 නීතියට අනුව සර්ෂියෝරාරි. තහනම් ( ප්‍රොහිබිෂන් ), ප්‍රොසිඩෙන්ඩෝ, මැන්ඩාමුස්, ක්වෝ වොරන්ටෝ යන රිට් ආඥා යම් මුල් අවස්ථා අධිකරණයක විනිශ්චයකාරවරයාට හෝ විනිශ්චය අධිකාරයට හෝ වෙනත් තැනැත්තෙකුට විරුද්ධව ප්‍රධානය කිරීමට සහ නිකුත් කිරීමට අභියාචනාධිකරණයට බලය ඇත.
- 🛠 මීට අමතරව හේබියස් කෝපුස් රිට් ආඥා නිකුත් කිරීමටද අභියාචනාධිකරණයට බලය ඇත. ඒ අනුව,
  - ❤ නීතිය අනුව ක්‍රියා කිරීම සඳහා යම් පුද්ගලයෙකු ඒ අධිකරණය ඉදිරියට ගෙන එන ලෙස හෝ
  - ❤ නීතිවිරෝධිව හෝ අනිසි ලෙස රජයේ හෝ පෞද්ගලික අත්අඩංගුවේ රඳවා තබා ගෙන ඇති යම් පුද්ගලයෙකු තම අධිකරණයඉදිරියට ගෙන එන ලෙස නියෝග කරමින් හේබියස් කෝපුස් රිට් ආඥාවක් නිකුත් කිරීමේ ප්‍රධානය කිරීමේ බලය මීට ඇත.

❤❤ එලෙස තම අධිකරණය ඉදිරියට ගෙන එන ලද කවර හෝ තැනැත්තෙකු නිදහස් කරන ලෙස හෝ රිමාන්ඩ් භාරයේ තබන ලෙස හෝ ඔහු සම්බන්ධයෙන් නීතියට අනුව අන්‍යාකාරයෙන් කටයුතු කරන ලෙසට නියම කල හැකිය.

# අභියාචනා විභාග කිරීමේදී අභියාචනාධිකරණය සතු බලතල

- යම් මුල් අවස්ථා අධිකරණයක විනිශ්චය අධිකාරයක හෝ වෙනත් ආයතනයක යම් ආඥාවක්, නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක් හෝ දණ්ඩණ නියමයක් නීතිය අනුව ස්ථිර කිරීම, ප්‍රතිවර්තනය කිරීම, නිවැරදි කිරීම හෝ සුලු වශයෙන් වෙනස් කිරීම සඳහා ඒ ඒ ආයතන සහ තැනැත්තන්ට විරුද්ධව විධාන නිකුත් කිරීමට හෝ

- අභියාචනාධිකරණය විසින් සලකන නියමයන් මත වැඩිදුර නඩු විභාගයක් පවත්වන ලෙස හෝ අලුතෙන් නඩු විභාගයක් පවත්වන ලෙස ආඥා නිකුත් කිරීමට හෝ
- වැඩි දුරටත් අලුත් සාක්ෂි භාර ගැනීම සහ පිලිගැනීමට ද

අභියාචනාධිකරණයට බලතල ඇත.

# ශ්‍රේෂ්ඨාධිකරණය ( Supreme Court )

- මෙය මෙරට ඉහලතම අධිකරණය වන අතර ශ්‍රේෂ්ඨාධිකරණය පිහිටුවා ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.
- ශ්‍රේෂ්ඨාධිකරණය මෙරට උත්තරීතරම අධිකරණය වන්නේය.
- ශ්‍රේෂ්ඨාධිකරණය මෙරට අවසානාත්මක අධිකරණය වන්නේය.
- ශ්‍රේෂ්ඨාධිකරණය මෙරට අවසානාත්මක අභියාචනා අධිකරණය වන්නේය.
- ශ්‍රේෂ්ඨාධිකරණයෙහි තීන්දු සහ ආඥා අවසානාත්මක සහ තීරණාත්මක විය යුතුය.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණ වලින් සියලු පහල අධිකරණ සහ අභියාචනාධිකරණය බැඳී සිටියි.
- ශ්‍රේෂ්ඨාධිකරණය, තමන්ගේම පෙර තීරණ වලින් බැඳී නොමැති අතර, එහෙත් ඒවා අනුගමනය කිරීම අපේක්ෂා කෙරේ.
- අභියාචනාධිකරණයේ මෙන් මෙම අධිකරණයේද විනිසුරු මණ්ඩලයකින් සමන්විත වන අතර ශ්‍රේෂ්ඨාධිකරණයේ සංයුතිය වන්නේ විනිසුරුවරුන් 6 දෙනෙකුට නොඅඩු සහ දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් විය යුතු බවට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රතිපාදන සපයා ඇත. මෙහි ප්‍රධානියා අග විනිසුරු ( අග්‍ර විනිශ්චයකාර ) නම් වේ.

පහත සඳහන් කාරණා ශ්‍රේෂ්ඨාධිකරණයේදී විභාග කෙරේ.

- 🏆 සිවිල් සහ අපරාධ යන ඕනෑම නඩු කටයුත්තක් සම්බන්ධයෙන් අවසාන අභියාචනා අධිකරණ බලය
- 🏆 මූලික අයිතිවාසිකම් නඩු විභාග කිරීම ( තනි සහ අනන්‍ය අධිකරණ බලය )
- 🏆 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපනය කිරීම( තනි සහ අනන්‍ය අධිකරණ බලය )
- 🏆 පනත් කෙටුම්පත් වල ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථානුකූලත්වය පරීක්ෂා කිරීම ( තනි සහ අනන්‍ය අධිකරණ බලය )
- 🏆 උපදේශාත්මක අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම ( තනි සහ අනන්‍ය අධිකරණ බලය )
- 🏆 පාර්ලිමේන්තු වරප්‍රසාද කඩකිරීම් පිලිබඳව විභාග කිරීම ( තනි සහ අනන්‍ය අධිකරණ බලය )
- 🏆 ජනාධිපතිවරණ සහ ජනමත විචාරණ ඡන්ද පෙත්සම් විභාග කිරීම
- 🏆 පාර්ලිමේන්තුව විසින් නීතියෙන් පවරනු ලැබිය හැකි වෙනත් යම් කාරණාවක් විභාග කිරීම
- 🏆 නීතීඥවරුන් බඳවා ගැනීම සහ ඔවුන්ගේ වෘත්තීය ආචාර ධර්ම සම්බන්ධ රීති සෑදීම

# ශ්‍රේෂ්ඨාධිකරණය සතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණ බලය

- පාර්ලිමේන්තුව විසින් පනවනු ලබන සෑම පනතක්ම මෙරට උත්තරීතර නීතිය වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුකූල විය යුතුය.
- පනත් කෙටුම්පතක් හෝ එහි යම් විධිවිධානයක් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුකූල වන්නේද යන්න තීරණය කිරීමේ තනි සහ අනන්‍ය අධිකරණ බලය ඇත්තේ ශ්‍රේෂ්ඨාධිකරණයටයි.
- ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ යම් ව්‍යවස්ථාවක් / විධිවිධානයක් සංශෝධනය කිරීම හෝ පරිච්චින්න කිරිම හෝ නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් පැනවීම සිදු කල යුත්තේ පාර්ලිමේන්තුවේ විශේෂ ( තුනෙන් දෙකක ) බහුතරයකින් පමණක්ද? එසේත් නැතිනම් එලෙස විශේෂ බහුතරයකට අමතරව එය ජනමත විචාරණයකින්ද අනුමත විය යුතුද? යන්න තීරණය කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණය සතුය.
- ජනාධිපතිවරයා විසින් අග්‍රවිනිශ්චයකාරවරයා අමතා කරන්නාවූ ලිඛිත ඉල්ලීමක් මත හෝ වෙනත් ඕනෑම පුරවැසියෙකු විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත මෙම අධිකරණ බයුලය ක්‍රියාත්මක කරවා ගත හැකිය.

# ශ්‍රේෂ්ඨාධිකරණය සතු මූලික අයිතිවාසිකම් විභාග කිරීමේ අධිකරණ බලය

- මූලික අයිතිවාසිකම් යනු මානව හිමිකම් වලින් අතිශයෙන්ම වැදගත් මානව හිමිකම් කොටසකි.
- මූලික අයිතිවාසිකම් පිලිබඳව අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදයෙහි සඳහන් වේ.
- මූලික අයිතිවාසිකම් පිලිබඳව නඩු කටයුතු විභාග කිරීමේ තනි සහ අනන්‍ය අධිකරණ බලය ඇත්තේ ශ්‍රේෂ්ඨාධිකරණයටය.
- ඒ අනුව යම් මූලික අයිතිවාසිකමක් හෝ භාෂා අයිතිවාසිකමක් යම් විධායක හෝ පරිපාලන ක්‍රියාවක් හේතුවෙන් කඩවීමකදී හෝ කඩවීමට ආසන්න අවස්ථාවකදී ඒ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් නඩුවක් පවරා සහන ලබා ගැනීමේ අයිතිය මෙරට පුරවැසියන්ට ඇත. එලෙස නඩු පැවරීම කල යුත්තේ අදාල කඩවීමට ලක්වූ පුද්ගලයා හෝ ඔහු වෙනුවෙන් නීතීඥ වරයෙකු විසින්, එම කඩවීමේ සිට මාසයක කාලයකට පෙරාතුවය.
- මෙම ක්ෂේත්‍රයේදී මෙරට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වඩාත් නිර්මාණශීලීව ජනතාවගේ මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් ක්‍රියා කර ඇති බව නිරීක්ෂණය කල හැකිය.

# අධිකරණ සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුලත් ප්‍රතිපාදන

- ■■ යුක්තිය පොදුවේ පරිපාලනය කිරීම
  - සෑම අධිකරණයකම සහ විනිශ්චය අධිකාරියකම නඩු විභාග ප්‍රසිද්ධියේ පැවැත්විය යුතුය. එහෙත් ජාතික ආරක්ෂාව, මහජන ආරක්ෂාව, පවුල් ආරවුල්, කුඩා දරුවන් සාක්ෂි දීම වැනි අවස්ථා මීට ව්‍යතිරේඛී අවස්ථාවන් වේ.

- ■■ අධිකරණයේ ස්වාධීනත්වය
  - බලතල බෙදීමේ න්‍යාය ප්‍රකාරව අධිකරණය, ව්‍යවස්ථාදායකයෙන් සහ විධායකයෙන් වෙන් කොට තැබීමට කටයුතු සලස්වා ඇත.

- ■■ අධිකරණ සේවා කොමිෂන් සභාව
  - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අධිකරණ සේවා කොමිෂන් සභාවක් පිහිටුවා ඇති අතර එයට, ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනාධිකරණයේ සහ මහාධිකරණයේ හැර සෙසු අධිකරණ වල නිලධාරීන් පත් කිරීම, ඉවත් කිරීම සහ විනය පාලනය සම්බන්ධයෙන් බලතල පැවරී ඇත.
  - ( ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනාධිකරණයේ සහ මහාධිකරණයේ විනිසුරුවරුන් පත් කිරීම සිදු කරන්නේ ජනාධිපති විසිනි.)

# අභියාචනා කිරීමේ ධුරාවලිය

– <u>සිවිල් නඩු කටයුතු සම්බන්ධයෙන්</u>

ශ්‍රේෂ්ඨාධිකරණය

සිවිල් අභියාචනා මහාධිකරණය

දිසා අධිකරණය

# අභියාචනා කිරීමේ ධුරාවලිය

– අපරාධ නඩු කටයුතු සම්බන්ධයෙන්

ශ්‍රේෂ්ඨාධිකරණය

↑

අභියාචනාධිකරණය

↑

පළාත්බද මහාධිකරණය

↑

මහේස්ත්‍රාත් අධිකරණය හෝ ප්‍රාථමික අධිකරණය

# අභියාචනා කිරීමේ ධුරාවලිය

– කම්කරු නඩු කටයුතු සම්බන්ධයෙන්

ශ්‍රේෂ්ඨාධිකරණය

පලාත්බද මහාධිකරණය

කම්කරු විනිශ්චය සභාව

# අභියාචනා කිරීමේ ධුරාවලිය

- රුපියල් මිලියන 20 ඉක්මවන වාණිජ ආරවුල් සම්බන්ධයෙන්

ශ්‍රේෂ්ඨාධිකරණය

↑

වාණිජ මහාධිකරණය

- විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණ විනිශ්චය මණ්ඩල ( Trial – at – Bar )තීරණයකට විරුද්ධව

ශ්‍රේෂ්ඨාධිකරණය

↑

විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණය